# සිංහ + ශාක්‍ය + හෙල = අබා

## ජැක්සන් ඇන්තනී විසිනි

කලා නිර්මාණයක් වෙනුවෙන් එහි නිර්මාණ ශිල්පියාට පෙනී සිටීමට සිදුවීම දුර්ලභව සිදුවන්නකි. නිර්මාණය යනු ශිල්පියා වැදූ දරුවා ය. එය ජනතාකරණය සිදුවූ පසු අයිතිය රසිකත්වයට පැවරේ. එහෙත් මේ රසික අයිතිවාසිකම වනාහි සහෘද (සමාන හදවතක් ඇති) සම්බන්ධතාවයකි. ඉන් කෘතියම බැබලෙනවා මිසක ඊට අනදර සිදුනොවේ. රසික සමාජය තුළ කෘතියට අසාධාරණයක් සිදුවන්නේ නම් නිර්මාණ ශිල්පියා වහාම කෘතිය වෙනුවෙන් පෙනී සිටී. ලෝකයෙත් ලංකාවෙත් එබඳු අවස්ථා අප ඕනෑ තරම් දැක තිබේ. බවතරණය වෙනුවෙන් මාර්ටින් වික්‍රමසිංහට පෙනී සිටීමට සිදුවිය. එහෙත් බවතරණයට එදා බැන වැදුනේ පොදු පාඨක සමාජය නොව එක්තරා සීමිත ගුරු කුල පාක්ෂික අතලොස්සකි. බවතරණයේ ප්‍රකාශනය පොදු සමාජ මූල කාරණයක් වූ නිසා විරුද්ධ වාදින් අත්ලොස්සක් වුවත් ඒ හඬ ප්‍රබලව ඇසුනි. පුරහඳ කළුවර වෙනුවෙන් ප්‍රසන්නටත් අක්ෂරය වෙනුවෙන් හඳගමටත් අධිකරණයේ පවා පෙනී සිටිමට සිදුවිය. ඒවා ඉතිහාස කථා නොවි ප්‍රබන්ධ කථා වු නිසා ප්‍රශ්ණය පැවතුනේ පැමිණිල්ල සහ විත්ති අතර පමණී. අබා හිතළු කථාවක් නොවේ. මේ කථා කරයා සත්‍ය යැයි විශ්වාස කරන ඉතිහාස කථාවකි. සමාජගත ඉතිහාසය මුලාශ්‍රයක් කලා නිර්මාණයක් සඳහා භාවිතා කිරීමේදී කොතෙක් පරිස්සම් සහ සූක්ෂම විය යුතුද යන්න මේ කථා කරයා හොඳින් හඳුනයි. එහෙත් අබා චිත්‍රපටය තුල ඉතිහාස ප්‍රකාශය කොයි ලෙසකින්වත් අවදානකමට ලක්නොවන්නේ යයි කථා කාරයා දැඩි ලෙස විශ්වාස කර ඇත. එහෙයින් අබා චිත්‍රපටය තිරගත වීමට මසකට මත්තෙන් සම්පූර්ණ අබා තිර කථාව මුද්‍රණද්වාරයෙන් එළි දැක්විණි.

චිත්‍රපටය අනුන්ගේ රඟහලක් තුල ප්‍රදර්ශණය වන්නකි  එය තමන්ට කැමති තැනක නතර කොට යලි  යලි පෙරලා බැලීමේ හැකියාවක් නැත. එහෙත් එම චිත්‍රපට කථාවම මුද්‍රණයකට ගත් කල එය පෙරල පෙරලා වැරදි ඇතොත් සොයා බැලියද හැක. මා අබා චිත්‍රපටයට පෙර පොත මුද්‍රණය කලේ එහි නිවැරදි බව මා තුල ස්ථාවරව පැවති නිසාය.

චිත්‍රපටය සීඝ්‍ර ලෙස ජනතා ප්‍රසාදය දිනාගෙන ඇත. එය දේශිය සිනමා කර්මාන්තය 61 වසරක් තුලම දිනාගත් ඉතාම ඉහල ප්‍රේක්ෂක ප්‍රතිචාර ලබමින් තවදුරටත් ප්‍රදර්ශනය වෙයි. දැනට චිත්‍රපටය තිරගත වී දින 50 ක් පසු වී ඇත. තිරගත වී සති 2 කින් පසුව නිර්නාමික විරුද්ධතාවන් මතුවිය. මාසයකින් පමණ සංවිධානාත්මක විරුද්ධතාවන් මතුවිය. එහෙත් චිත්‍රපටය තුල තවදුරටත් ප්‍රේක්ෂකයින් රොක් වෙමින් පවති.

මේ විරුද්ධ කරුවන්ගේ නැගෙන ප්‍රශ්ණ පිළිබඳව භ්‍රාන්තියට පත් වී හිඳිමි. මන්ද යත් මේ කිසිඳු ප්‍රශ්ණයක් චිත්‍රපටය විසින් මුදාහල ප්‍රශ්ණයන් නොවීමය. චිත්‍රපටයේ නැති මත වාද චිත්‍රපටයට ''ඔබා'' එය විවේචනය කිරීම ත්‍රාස්ජනකය. ඒවා විචාර සේ පිලිගත නොහැක. නිර්මාණය පිළිබඳ කුමක් කීවද ඒවා මත ප්‍රකාශ මිසක් ප්‍රශ්ණ කිරීම නොවන්නේය. කලා විචාරකයින් චිත්‍රපටය විචාරය කරනවා මිසක් නිර්මාණ ශිල්පියාගෙන් ප්‍රශ්ණ අසන රටක් අප දැක නැත. එහෙයින් කලා විචාර වලට පිලිතුරු දෙන නිර්මාණ ශිලපින් ගැනද අප අසා නැත. ප්‍රශ්ණ අසන්නන් කලා විචාරකයින් නොවීමත්ල එවා තුල ප්‍රශ්න ඇතුලත් වී තිබීමත් හේතුකොට ගෙන කලා කරුවාට තම නිර්මාණය වෙනුවෙන් පෙනී සිටීමට හා පිලිතුරු දීමට දැන් කාලය එලඹ ඇත. එහෙයින් මම එසේ කරමි.

මේ සියළු ප්‍රශ්ණ අතර තිබූ අති මුග්ධ තම ප්‍රශ්නය නම් මා ''ජාතියේ මාතාව වූ උන්මාද චිත්‍රාව අනාචාරයේ හැසීරුවා තිබීමලු.'' තුච්ච නින්දිත කාම චිත්‍රපටය නරඹා පිළිකුල් රසිකත්වයක් තනා ගත් නැහැදිකියකට මිසක අබා නරඹන කිසිදු ප්‍රේක්ෂකුට එසේ සිතා ගත නොහැක. මේ සියලු වරද්දාගැනීම් සඳහා හේතුභූත වී ඇත්තේ එක් ප්‍රබල වරද්දා ගැනීමකි. එනම් අබාගේ පියා චිත්තරාජ යැයි මේ චිත්‍රපටයේ මතවාදයක් ඇතැයි පෙළඹෙන වරද්දා ගැනීමය. එබදු මතවාදයක් මහා වංශයේ

27 වන පිටුවට

